

පරිසරලෝලියකු දුටු

## ලස්සනම තැන

# රුමස්සල මුහුදේ සැඟවුණු පරාදීසය



රුමස්සල මුහුද




කොරල් තවානක්









**පරිසරලෝලී ඔබ අප සියලු දෙනා බොහෝ විට දකින්නේ ගොඩබිම සුන්දරත්වයයි. එහෙත් සාගර පත්ලේ වෙනම ලොවක් ඇත්තේ අප බහුතරයකගේ ඇසින් සැඟවීගෙනය. පරාදීසයක් බඳු ඒ සයුරු පත්ල හා එහි සිදුවන විවිධ විපර්යාසයන් සියැසින් දුටුවකු සමග අද අපි පරිසරලෝලියකු දුටු ලස්සනම තැනින් සාකච්ඡා කරමු. ඒ චිත්‍ර ශිල්පියකු හා ඡායාරූප ශිල්පියකු හා කිමිදුම්කරුවකු ද වන ප්‍රසන්න වීරක්කොඩි සමගය.**

ඔබ කොයිතරම් සංචාරයේ යෙදී තිබෙනවා ද? ඒ අවස්ථාවල ඔබ සතුන් සිව්පාවුන් දැක ඇත්තේ කෙතරම් දුරින් ද? ඔතැම වනජීවී උද්‍යානයක හෝ සතුන් වත්තේ හෝ වේවා ඔබට ඔබ කැමැති සත්ත්වයකු සමග එක ළඟ හිඳිමින් එකට වැදි වැදී සංචාරයේ යෙදෙන්නට අවස්ථාව ලැබී තිබෙනවා ද? විශේෂයෙන් වන අලියෙක්, දිවියෙක් ළංවන විට ඔබට සංචාරය අමතක වී අතතුර සිහි නොවන්නේ ද? ඒ මෙතෙක් ඔබ සංචාරය කර ඇත්තේ ගොඩබිම පමණක් නිසාය.

මුහුදේ අත්දැකීම හාත්පසින්ම වෙනස් ය. ඒ කතාව ප්‍රසන්න වීරක්කොඩි ඇරැඹුවේ මෙසේ කියමිනි.

"මාළුන් අපි එක්ක කොච්චර යාළු වුණා ද කිවොත් පින්තූරයක් ගන්න ඒ අයව ඈතට තල්ලු කරන්න සිද්ධ වුණා."

ඒ කතාව මුලින්ම අප පිළිගත්තේ ද නැත. එහෙත් මුල සිට කතාව අසා සිටිද්දී ජීවිතයේ අරමුණු දෙක සාගරයත් සිත්තමත් වූ අයකුට අනුව එය පිළිගත හැකි යැයි අපට ද සිතෙන්නට විය.

මහානාම හා රාජකීය විද්‍යාලවල අධ්‍යාපනය ලබමින් සිටියදීම මම තරුණ සත්ත්වවේදීන්ගේ සංගමයටත් සම්බන්ධ වෙලයි හිටියේ. ඒත් අනිත් සියලු දෙනාම යන අතට වඩා වෙනස් අතක යන්න ඕන කියලා මට මුල ඉඳන්ම හිතුණා. තාත්තාගේ යාළුවෙකුගෙන් මුහුද යට දන 'මාස්ක්' එකක් හම්බුණා. මුහුදට ආශාවකුත් තිබුණ නිසා වැල්ලවත්තේ මුහුදට බැස්සා ටියුබවලින්. ඒ කාලේ රට පුරාම වුණත් වැල්ල හරිම පිරිසුදුයි. පීනන්න බැරි වුණත් ත්‍රාසජනක ක්‍රියාවලට කොල්ලෝ ඉතිං ආසයිනේ?"

එසේ මුහුද සමග හාද වූ ඔහු තරුණ සත්ත්ववේදීන්ගේ සංගමය නිසා මාළුන් වර්ග හඳුනා ගත්තේය. අසූව දශකය මුල භාගයේ හුස්ම බටයක් හා මුහුණු ආවරණයක් පමණක් පැලඳ වැල්ලවත්තේ මීටර 300 ක පමණ මුහුදු තීරයේ හමුවන කොරල් දකින්නට ඔවුන් ගියේ මිත් මැදුරේ සේවය කළ උදය වික්‍රමසිංහ ද සමගය.

"විකී අය්යා දවසක් කිවා රුමස්සල යනවා කියලා. අපිත් කොල්ලෝ 4 – 5 ලෑස්ති වෙලා ගමනට එක්වුණා. ගාලු බොක්කේ මාතර පැත්තේ කොනේ රුමස්සල කන්දේ කෙළවරක පුංචි වැල්ලක් හම්බෙනවා. එතනට ගියා. ඒ කාලේ වෙරළ තීරුව කැලේ. කන්ද උඩින් බැහැලා එන්න ඕනෙ. ලස්සන වැලිතලාව. වඳුරෝ, මුහුදු රාජාලි, වගේ උනුත් ඉන්නවා. එක පැත්තකින් දියඇල්ලක් පීල්ල වගේ වැටෙනවා. ඉඳලා හිටලා සුරතල් මසුන් අල්ලන කෙනෙක් දෙන්නෙක් ඇරුණාම වෙන කවුරුත් නෑ. ඒක අපේම පෞද්ගලික වෙරළ තීරයක් බවට පත්වුණා. අපි ගෙනියන කෑම ටික ඉවර වෙනකල් එහේ ඉන්නවා. ඊට පස්සේ ගෙදර ඇවිත් ආයෙ යනවා.

"තිදු ගත්තේ වැල්ලේ වළක් හාරගෙන වහගෙන. එහා පැත්තේ කැලේ මෙහා පැත්තේ මුහුදට බැස්සාම මට කියන්න වචන නෑ. ඒක හීන ලෝකයක්. පරාදීසයක්."

ප්‍රසන්න ඇතුළු කණ්ඩායම මේ සිහින ලෝකයේ ගිලී නිකම්ම සිටියේ නැත. වින්දනය මෙන්ම අධ්‍යයනය සඳහා යොමු වූ ඔවුහු රුමස්සල කොරල් හා මාළුන් හඳුනා ගැනීමේ දැඩි ප්‍රයත්නයක යෙදුණහ.

"අපට ඒ කාලේ තිබුණේ මොත්රෝගේ පොත විතරයි. ඒ අතර නාරා ආයතනයේ ආචාර්ය රංජිත් ද සිල්වා යටතේ කොරල් ඒකකය පටන්ගත්තා. අපි ඒකට බැඳුණා. එහි අපට පොත් තිබුණා හරි විදිහට ඉගෙන ගන්න. බ්‍රිතාන්‍ය යටත් විජිත කාලෙන් පස්සේ අපේ මුහුදු ජෛව විවිධත්වය ගැන මා දන්න තරමත් හරි විදිහේ අධ්‍යයනයක් කෙරිලා තිබුණේ නෑ. අපට පුළුවන් වුණා ඒ පාදම සකසන්න."

ඔහු තරමක අභිමානයෙන් කීවේය. ඉන් පසු ඔක්සිජන් ටැංකිය පිටේ බැඳගෙන ස්කුබා කිමිඳුම් (SCUBA Diving) කරන්නට තරම් ප්‍රසන්න වීරක්කොඩි නම් කිමිදුම් කරුවාට හැකිවිය.

ඒ වුණාට ඇත්තම කීවොත් අදටත් මට හරියකට පීනන්න බෑ."

ඉන්පසු ඔහු කීවේ ලංකාවේ මසුන් ගැනය.

"ඉන්දියානු සාගරයේ වැඩියෙන්ම මෝරු අල්ලන රටක් ලංකාව. මිනිස්සු මෝරුන්ට කාලා කාලාම මෝරු මිනිසුන්ට බයවෙලා. අපි ගිය මුල් කාලේ මෝරු අපි ළඟින්ම පීනනවා කිසි හානියක් නැහැ. හැබැයි ජීලාවා නම් හපන්න බලනවා. හරියට පාරේ ඉන්න බල්ලෝ වගේ. බ්ලැක් ටිප් රීෆ් ෂාර්ක්, වයිට් ටිප් රීෆ් ෂාක් වගේ අය අතරේ අපිත් පීනනවා. සාමාන්‍යයෙන් වෙරළ අයිනේ ඉන්නේ මිටි මෝරු. උස් අඩි හයයි හතයි දිග. ඒ කියන්නේ අපේ උස. ඉතින් ඒ අය අපිව කන්නේ නෑ. හැබැයි කලබල කලොත් ටිකක් අනතුරුදායක වෙන්න පුළුවන්."

මෙතැනින් එහා කතාව ඔහු කියන්නේ තරමක සසල වූ ස්වරයකිනි. එය ඔහුට තමන්ගේ නෑදෑයකු හා සමාන රුමස්සල කොරල් පරයේ ජීවිත කතාවයි.

"මම ජීවිතේ ගැන ඉගෙන ගත්තේ, ඇත්තෙන්ම මගේ සැබෑ විශ්ව විද්‍යාලය වුණේ රුමස්සල. රුමස්සල ලස්සන නිසාම ප්‍රදේශයේ මාළු ඇල්ලීම වැඩිවුණා. ඒ වගේම කෑමට ගන්න මාළුන්ට ඩයිනමයිට් දල ඇල්ලුවා. 90 දශකය වෙද්දි ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතියෙන් කොරල් පරයත් අහුවන කොටසක් පුරවලා කොරල් පරය උඩ කන්ටේනර් අංගණයක් හදන්නයි තිබුණේ.

මේ වෙද්දි අපි හංගාගෙන හිටිය අපේ පෞද්ගලික හීන පරාදීසය ලෝකෙට හෙළි නොකළොත් බේරගන්න බැරි වෙනවා. අපි නාරා එකෙන් අයින් වෙලා "සොබාදහම සුරකින්නෝ සංවිධානය" හදගෙන 1992 සිට 94 දක්වා සම්පූර්ණ සමීක්ෂණයක් කරලා වාර්තාවක් ලබා දුන්නා රුමස්සල කොරල් පරය ගැන. ඒ අනුව මාළු විශේෂ 530 වැඩිය, කොරල් විශේෂ 70 ට වැඩිය, දර කැස්බෑවන්, පොතු කැස්බෑවන්, මඩ කැස්බෑවන් වගේ ඒ හරියට විශේෂ ජීවීන් හා දුර්ලභ වර්ග ගැන සටහන් කළා. 95 ගාලු ටවුමේ මුහුදු ජීවීන් ගැන ප්‍රදර්ශනයක් කළා. මේ දේවල් එක්ක අපේ පෞද්ගලික පරාදීසය දරුණු


අරුණි මුතුමලී
ඡායාරූප - සුදම් ගුණසිංහ


ලෙස 'පොදු' වෙන්න පටන්ගත්තා. වරාය නම් අද වෙනකල් හැදුණේ නෑ. ඒත්...

ඔහු නැවතුණේය. දෛවය ආපස්සට හැරවීම යනු ඉතා බැරෑරුම් ක්‍රියාවලියකි. සිදුවන්නට නියමිත දේ මේ මොහොතේ නැත්නම් ඊළඟ මොහොතේ වෙනත් මුහුණුවරකින් හෝ සිදු වනවාමය.

"90 මැද වෙද්දි කොරල් පරයට මිනිසුන්ගෙන් වන විනාශයට වඩා වේගයෙන් සොබා දහමෙන් පහර වදින්න ගත්තා. ආක්‍රමණශීලී ජීවීන් අප හිතලාවත් නොතිබුණු දෙයක්. මෝඩ ඇළ කියලා අපි කියන කුණු වතුර පාර නිසා පරය කුණුවලින් වැහෙන්න ගත්තා. ආක්‍රමණශීලීකයින් වැඩිවුණා. අපි ඒ කුණු ඇද ඇද කොරල් පරය ශුද්ධ කළා. අන්තිමේදී 96 මහා කුණාටුවක් ඇවිත් කොරල් පරයේ පැත්තක්ම කුඩු වෙලා විනාශ වෙලා ගියා. ඒ තමයි අපේ පළමුවැනිම ඛේදජනක අත්දැකීම."

ඔහු දබර ඇඟිල්ලත් මහපටැඟිල්ලත් ඇස්මුල්වලට තබා තද කරගත්තේය.

"අපි ඒ කැලි එකතු කරලා එක එක විදිහට වවන්න හැදුවා. කොරල් ගහක් වගේ හිටියට සතෙක්. කාර්යය හැටියට කරන්නේ ගස්වල කාර්යය. එයාගේ ඇතුළේ ඉන්න සූසැන්තිලේ කියන ඇල්ගී විශේෂය නිසා තමයි ඒගොල්ලන්ට පාට ලැබෙන්නේ. කොරල් යම් පීඩාවකට ලක්වුණ ගමන්; ඒ කියන්නේ අධික උණුසුමකදී වගේ මුලින්ම කරන්නේ ඒ ඇල්ගී එක ඇඟෙන් පිටකරන එකයි. එතකොට පාට නැති වෙලා සුදු පාටක් වෙනවා. හරියට හිම කාලෙට ගස් රිදී පාටින් වැහුණා වගේ."

ඒ අත්දැකීම ඔවුන් ලැබුවේ 1998 අප්‍රේල් 8 වැනිද සිටය. අප සියලු දෙනා විඳවූ එල්නිනෝ ඔබට මතක ද? කොරල් පරවල ඉරණම විසඳන්නට ඊළඟට ආවේ එල්නිනෝවය.

'98 අප්‍රේල් 08 කොරල් ටික ඇල්ගී පිට කරන්න ගත්තා. අපි දන්නවා ඊළඟට මොකද වෙන්නෙ කියලා. හරියට පිළිකා රෝගී නෑදෑයෙක් දිහා බලන් ඉන්නවා වගේ අපි මුහුදේ උණුසුම් දියරැලි එද්දි කොරල් පරවල පාට සුදු හිම වගේ වුණා. අපී වෙරළට වෙලා ඇඬුව දවස් තිබුණා.

"අපි යාළුවන්ගේ ගෙවල්වල යනවා වගේ ඒ ඒ මාළුන් ඉන්න ගුහා ගාවට ගියේ. ඒගොල්ලවන් අපිව අඳුනනවා. අපි ගියාම ළඟට එනවා. ඒත් ඒ අයටත් සහජීවනයත් නැතිව ක්‍රමයෙන් අඩුවෙලා ගියා. අපේ හීන පරාදීසය ගල්ගැසුණු මළවුන්ගේ ලෝකයක් වුණා."

එහෙම සියල්ල විනාශ වන විට ද ඈත කොණක බලාපොරොත්තුවක් දලුලන අවස්ථා අපි අනන්තවත් අත්විඳ ඇත්තෙමු. ඇතැම් විට ඒවා අතු ඉතිලා වැඩෙයි. ඇතැම් විට ඒවා ද වැනසී යයි. රුමස්සලට වුණේ කුමක් ද?

"මොකද කරන්නේ කියලා හිතාගන්න බැරුව ඉද්දි අපි දැක්කා පුංචි පුංචි හතු වගේ ආයෙ එහෙත් මෙහෙත් කොරල් මලක් දෙකක් පිපෙනවා. කලින් වතාවල්වල අත්දැකීම් තිබුණු නිසා අපි මේක කොහොමහරි ගොඩදන්න හිතාගෙන ආපහු හිටවන්න ගත්තා. 2007 වෙද්දි සියයට 50 ක් විතර වර්ධනය වුණා. මුව අං කොරල් මත තමයි ඒවා ගොඩක් හැදුණේ. ඒ වුණාට අපේම මිනිස්සුන්ට ඉවසීමක් නැතිව ගියා. තණ්හාව මතු වෙන්න ගත්තා. සාමාන්‍යයෙන් කොරල්වලට නිදහසේ වැඩෙන්න දෙනවානම් ඒවා හොඳට හැදෙනවා . හැබැයි මාළු එහෙම ඉන්න ඕන. විශේෂයෙන් සුරතල් මසුන් ඇල්ලීමත් වැඩි වුණාට පස්සේ පරිසර පද්ධතිය සම්පූර්ණයෙන් බිඳ වැටුණා. සොබා දහමත් හිතන්න ඇති අපට දකුණේ ලස්සන මුහුදක් ඕන නැහැ කියලා. 2007 ආව විශාල කුණාටුවකින් මුව අං කොරල් කැඩිලා ඒ හැදුණු ටිකත් නැත්තටම නැති වුණා. එතනින් අපේ රුමස්සල හීනය ඉවර වුණා."

යම් සිහිනයක් කුඩු වී විනාශ වී ගිය තරමින් මිනිස් අප බලාපොරොත්තු බිඳලා ගත යුතු නැත. ඒ පාඩම අපට කියා දෙන්නේ ද කොරල් පරමයි. ඒත් රුමස්සල නම් නොවෙයි. ඒ නිසා ප්‍රසන්න වීරක්කොඩිගේ මේ ඉල්ලීමට ද අප අවධානය යොමු කළ යුතුමය.

"දකුණේ කොරල් පරවල මුළු ජීවිත කතාවම මම ඇහින් දැක්කා. දැන් ඒ ගැන බලාපොරොත්තුවක් නෑ. ඒත් අවුරුදු 30 ක යුද්දෙන් පස්සේ උතුරේ මුහුද, පරෙවි දූපත් ආශ්‍රිතව එහෙම එදා අපි 80 දශකයේ දැක්ක විදිහටම මාළු වලාකුළු පේනවා. පාට පාට කොරල් ඉතිරි වෙලා එදා රුමස්සල වගේම දකින්න පුළුවන්. අපේ හීන ආයෙත් අලුත් වුණා.

ඒත් මේ තමයි සොබා දහම අපට දී තිබෙන දෙවැනි අවස්ථාව. මෙයත් රුමස්සල වගේ විනාශ කර ගත්තොත් අපේ රටේ ලස්සන මුහුදක් ගැන අපට කතා කරන්න දෙයක් ඉතිරි වන එකක් නැහැ."